2488/69
2026.05.17

රේගු නිවේදනයයි

රේගු ආඥා පනත (235 වැනි අධිකාරය)

1988 අංක 83 දරන පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය) වන රේගු ආඥා පනතේ 10 (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, 2026 මැයි මස 15 දිනැති අංක 2488/56 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත නියමයේ අවසන් ඡේදයට පසුව පහත ඡේදය ඇතුලත් කරමින් 2026 මැයි මස 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරනු ලබන බවට මෙයින් ප්‍රකාශයට පත් කරමි.

2026 මැයි මස 15 දින හෝ ඊට පෙර ණයවර ලිපි විවෘත කරන ලද , එහෙත් එදිනට පසුව අදාළ ණයවර ලිපි/ ලිපියේ,

(අ) වාහන සංඛ්‍යාව,

(ආ) වාහනය හඳුනාගැනීමේ අංකය,

(ඇ) වාහනයේ විස්තරය,

(ඈ) වාහනයේ තාක්ෂණික පිරිවිතරයන්, යන ඉහත එකක් හෝ කිහිපයක් සංශෝධනය කිරීමක් සිදුකර ඇත්නම්, 2026 මැයි මස 15 දිනැති අංක 2488/56 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත අධිභාරය අදාළ කර ගත යුතු බවට මෙයින් නියම කරමි.

අනුර කුමාර දිසානායක
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026 මැයි මස 17 වැනි දින
කොළඹ 01.
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.